

දිනමිණ



කාලයේ සිතුවිලි පොතක් දැරිය අද සමඟ සතියට

The Dinamina | 1909 ඇරැඹි ශ්‍රී ලංකාවේ ජාතික පුවත්පත | தினமின

ශ්‍රී බුද්ධ වර්ෂ 2564ක් වූ දුරුතු පුර පසළොස්වක ලත් සඳු දින | කාණ්ඩය 112 | පත්‍රය 28 | පිටු 24 | මිල රු.30 | web: www.dinamina.lk | ශ්‍රී ලංකාවේ ලියාපදිංචි කළ පුවත් පතකි | 2021 ජනවාරි 18 සඳුදා

පාරම්පරික වගාවලට බාධා එපා

ජනපතිගෙන් නිලධාරීන්ට නියෝග

මහින්ද අලුත්ගෙදර

ගැටලු නිරාකරණය වන තෙක් කිසිදු බාධාවකින් තොරව සහ අඛණ්ඩව වගා කටයුතුවල නිරත වීම සඳහා සියලු ගොවීන්ට පූර්ණ අනුමැතිය දීමට ජනාධිපති ගෝඨාභය රාජපක්ෂ මහතා තීරණය කර තිබේ.

පාරම්පරික වගා වැඩට බාධා නොකරන්නැයි ජනාධිපතිවරයා වනජීවී, වන සංරක්ෂණ, පරිසර, පොලීසිය ඇතුළු සියලු ආයතනවල නිලධාරීන්ට නියෝග කර තිබේ. පොළොන්නරුව, මැදිරිගිරිය, වෙඩිකච්චිය ග්‍රාමයේ පැවති 'ගම සමඟ පිළිසඳර' 6 වැනි වැඩසටහනට සහභාගි වූ ජනාධිපති ගෝඨාභය රාජපක්ෂ මහතා වෙත ප්‍රදේශයේ ගොවි ජනතාව ඉදිරිපත් කළ ගැටලු සම්බන්ධයෙන් විශේෂ අවධානයක් යොමු කරමින් ජනාධිපතිවරයා මේ තීරණයට එළැඹීය.

පිට 06

මේ වසර අවසානයට පෙර අලුත් ව්‍යවස්ථාව පාර්ලිමේන්තුවට

අසේල කුරුලුවංශ

මෙම වසර අවසන් වීමට ප්‍රථම නව ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවක් සකස් කර පාර්ලිමේන්තුවට ඉදිරිපත් කිරීමට රජය අපේක්ෂා කරන බව අධ්‍යාපන අමාත්‍ය, මහාචාර්ය ජී.එල්. පීරිස් මහතා පැවසීය.

රොමේෂ් ද සිල්වා මහතාගේ සභාපතිත්වයෙන් යුත් විශේෂඥ කමිටුවක් මේ සඳහා පත් කර තිබෙන බවත්, වසර 43ක් පැරණි 1978 ව්‍යවස්ථාවේ පැහැදිලි වෙනසක් සිදු විය යුතුව තිබෙන බවත් ඒ මහතා කීවේය.

පිට 06

හමුදා - අසල්වැසි ක්ෂණික ක්‍රියාන්විතය වැළලෙන්න ගිය ජීවිත දෙකක් බේරා ගනී

...දේශයේ නිවෙසක ...ගේරුවන් දෙදෙ... ...වැටීම නිසා සිදු

වීමට ගිය ජීවිත විනාශයක් ආරක්ෂක අංශ ප්‍රදේශවාසීන්ගේ සහයෝගය ඇතිව පැයක් පුරා සිදු කළ මෙහෙයුමකින් වළක්වා ගැනීමට රටේ (17) හැකියාව ලැබිණි.

පිට 06

දැන් ආණ්ඩුවක් ගැනීම කොරෝනා හැදුණා වගෙයි

පිට 06

පොළොන්නරුව, මැදිරිගිරිය, ... ග්‍රාමයේදී පැවැති ගම සමඟ පිළිසඳරක් වැඩසටහනට පෙර වූ ජනාධිපති ගෝඨාභය රාජපක්ෂ මහතා බිසෝපුර මහවැලි ප්‍රාථමික විද්‍යාලය විවෘත කිරීමේ අවස්ථාවට ද සහභාගි වූයේය. මේ විද්‍යාලය ඉදිකිරීමේ දී මූලිකත්වය ගෙන කටයුතු කළ හිටපු ජනාධිපති මෛත්‍රීපාල සිරිසේන මහතා විද්‍යාලය විවෘත කරන ලෙස ජනාධිපතිවරයා මෙහිදී ආරාධනා කළ අතර, ඒ අනුව හිටපු ජනාධිපතිවරයා පාසල විවෘත කළ අයුරු.

ඉන්දියාවේ කොවිඩ් එන්නත්කරණ වැඩසටහනට අගමැතිගෙන් සුබ පැතුම්

මහින්ද අලුත්ගෙදර

ඉන්දියාව ආරම්භ කළ ලොව විශාලතම කොවිඩ් එන්නත්කරණ වැඩසටහන සම්බන්ධයෙන් අගමැති මහින්ද රාජපක්ෂ මහතා ට්විටර් පණිවිඩයක් නිකුත් කරමින් සිය සුබපැතුම් එක් කර තිබේ.

පිට 06

යුද හමුදාවේ මහ පුටු 89කට උසස් වීම්

හමුදාපති නිර්දේශ කරයි

සේවා අවශ්‍යතාව මත පත් කිරීම් සිදු කරනවා

මාධ්‍ය ප්‍රකාශක බ්‍රිගේඩියර් චන්දන වික්‍රමසිංහ

පිට 06

ඉකුත් වසරේ විදෙස් ආයෝජකයන් රට හැර යෑමෙන් කෝටි 5,100ක් අහිමි වෙලා

පිට 06

දළදා මාලිගා පොලීසියේ පිරිසකට කොවිඩ්

නිලධාරීහු 231ක් නිරෝධායනයට

අසේල කුරුලුවංශ

මහනුවර ශ්‍රී දළදා මාලිගා පොලිසියේ නිලධාරීන් පිරිසකට කොවිඩ් ආසාදනය වීම හේතුවෙන් පොලිස් නිලධාරීන් 231 දෙනකු ස්වයං නිරෝධායනයට යොමු කර වෙනත් කණ්ඩායමක් එහි සේවයට යෙදවූ බව මහනුවර ජ්‍යෙෂ්ඨ පොලිස් අධිකාරී සුදත් මාසිංහ මහතා පැවසීය.

පිට 06

පහ ශ්‍රේණිය ශිෂ්‍යත්ව විභාගය 2020 ප්‍රතිඵල මත 2021 වසරේ 6 වැනි ශ්‍රේණියට සිසුන් ඇතුළත් කර ගැනීමේ පාසල් කඩඉම් ලකුණු 20 වැනි පිටුවේ.

කොවිඩ් හමුවේ ඡන්ද පැවැත්වීම ගැටලුවක්

නදී මාණික්කගේ

පළාත් සභා සියල්ල ආණ්ඩුකාරවරුන් යටතේ පවතින... ...ත්වය හමුවේ ඡන්දය පැවැත්වීම පිළිබඳ ගැටලුවක් ඇති බව ජනතා විමුක්ති පෙරමුණේ දේශපාලන මණ්ඩල සභික කේ. ඩී. ලාල්කාන්ත මහතා පසුගියදා (15) පැවති මාධ්‍ය සාකච්ඡාවේදී පැවසුවේය.

පිට 06

උපකාරක පන්ති ලබන සඳුදා සිට

මහින්ද අලුත්ගෙදර

කොවිඩ් -19 වසංගත තත්ත්වය හේතුවෙන් දැනට නවතා දමා ඇති උපකාරක පන්ති පවත්වන සඳුදා (25) සිට ආරම්භ කිරීමට රජය තීරණය කරයි.

එම උපකාරක පන්ති පැවැත්වීමට අදාළ චක්‍රලේඛය මේ වනවිට නිකුත් කර තිබෙන අතර, ඒ අනුව ජනවාරි මස 25 වැනි දින සිට උපකාරක පන්ති පැවැත්වීමට අවසර දී ඇති බව සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ ජනරාල් වෛද්‍ය අසේල ගුණවර්ධන මහතා ප්‍රකාශ කළේය.

පිට 06

සහන තේ තොගයක් සතොස ගබඩාවක සඟවා අස්සේ

පිට

යුද අපරාධ සොයන්න ස්වාධීන යන්ත්‍රණයක් හදන්න

දෙමළ පක්ෂ මානව හිමිකම් කොමිසමට කියයි

මහින්ද අලුත්ගෙදර

පසුගිය යුද සමයේදී සහ ඉන් පසුව මෙරට සිදු වූ බව පවසන යුද අපරාධ සහ මානව හිමිකම් උල්ලංඝනය කිරීම් සම්බන්ධයෙන් විමර්ශනය කිරීම සඳහා ස්වාධීන යන්ත්‍රණයක් පිහිටුවන්නැයි දෙමළ දේශපාලන පක්ෂ සහ සංවිධාන කිහිපයක් එක්සත් ජාතීන්ගේ මානව හිමිකම් කවුන්සිලයෙන් ඉල්ලීමක් කර තිබේ.

පිට 06

- වන්දන් මිනිහට අරක්කන්ත තමයි මහ ලොකු ගන්නා නියලට ඇමති ... රාජාතුගේ කියන්නෙ..!
- විදුලිය ඇරියෙන් ගිහිල්ලා නිදහස් කළාට මහපොළොවම ආරක්ෂා කරන්නෙ නෑ ගන්නා......!